**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 03 - 2020**

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘති 03හි 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව සමඟ 2016 අගෝස්තු 11 දින එළඹි ව්‍යාපෘති ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(l) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂන මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 03 ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගිවිසුම හා ණය ගිවිසුම අනුව, එවකට නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය වැඩසටහන - ව්‍යාපෘති 03හි ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන - ව්‍යාපෘති 03හි ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහන - ව්‍යාපෘති 03හි අරමුණ වනුයේ මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පද්ධති කාර්යක්ෂමතාවය වැඩිදියුණුකිරීම හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 03 ක් යටතේ ක්‍රියාත්මක වේ ඒවා නම්, ව්‍යාපෘති සංවර්ධන ආධාරක උපදේශණ කොන්ත්‍රාත්තුව, ව්‍යාපෘති - 01 සඳහා අතිරේක මුදල් සැපයීම සහ ව්‍යාපෘති - 02 සඳහා අතිරේක මුදල් සැපයීම වේ. ණය ගිවිසුම් අනුව, වැඩසටහන - ව්‍යාපෘති 03හි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 29,642.60 කට සමාන එජඩො මිලියන 228.02 ක් වූ අතර ඉන් රු.මිලියන 15,990 කට සමාන එජඩො මිලියන 123 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යායනය කිරීම සඳහා හා රු.මිලියන 650 කට සමාන එජඩො මිලියන 05 ක් ආසියානු සංවර්ධන අරමුදලේ විශේෂ අරමුදල් සම්පත් මගින් මූල්‍යායනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඊට අමතරව, රු.මිලියන 7,742.80 කට සමාන එජඩො. මිලියන 59.56 ක් යුරෝපීය ආයෝජන බැංකුව (යු.ආ.බැ) මඟින් මූල්‍යායනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 5,259.8 කට සමාන එජඩො මිලියන 40.46 ක් ශ්‍රී ලංකා රජය විසින් දායකවීමට අපේක්ෂා කර තිබුණි. තවද වැඩසටහන - ව්‍යාපෘති 03හි මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 7,231.90 කට සමාන එජඩො මිලියන 55.63 ක මුදලක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 22,410.70 කට සමාන එජඩො මිලියන 172.39 ක මුදලක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන - ව්‍යාපෘති 03 හි කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන - ව්‍යාපෘති 03 හි කාර්යයන් 2016 නොවැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2020 ජුනි 30 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. ඉන් අනතුරුව වැඩසටහන - ව්‍යාපෘති 03 හි කාල සීමාව 2022 ඔක්තෝබර් 24 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, වැඩසටහන - ව්‍යාපෘති 03හි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
වැඩසටහනේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථානෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | වැඩ සටහන ව්‍යාපෘති 03 යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා කොළඹ මහනගර සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති 02ට අදාලව එකතුව රු.මිලියන 249.67 කට සමාන එ.ජ.ඩො. මිලියන 1.42 ක පොලී හා බැඳීම් ගාස්තු ණය නියෝජිත ආයතනය විසින් මෙම ණය මුදලින් ලැබෙන මුදල් වලින් අයකර ගෙන තිබුණි. කෙසේ වෙතත්, එම අයකරගත් මුදල් ක්‍රියාත්මක කරනු ලබන නියෝජිත ආයතනයන් දෙක අතර බෙදාවෙන්කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දින දක්වා මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයන් වශයෙන්, ණය මුදල් ලැබීම් එයට සමාන ප්‍රමානයෙන් අඩුවෙන් දක්වා ඇත. | 249.67 | කොළඹ මහ නගර සභාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ආසියානු සංවර්ධන බැංකුව සමඟ එක්ව 2021 වර්ෂයේ සිට පොලී හා බැඳීම් ගාස්තු බෙදා වෙන් කිරීමට හා ඒ අනුව ගිණුම් පොත්වල ගිණුම්ගත කිරීමට නිසි ක්‍රමවේදයක් සකස්කරනු ඇත. | වසර අවසාන වන විට උපයෝජනය කළ ණය මුදල පෙන්විය හැකි වන පරිදි ණය නියෝජිතායතනය විසින් සෘජුව අයකරගන්නා ලද අදාල පිරිවැය ව්‍යාපෘති අතර නිසි ලෙස බෙදාවෙන් කොට ගිණුම් වලට ගෙන ආ යුතුය. |
| (ආ) | රු.713,409 ක විනිමය ලාභය මූල්‍ය තත්ව ප්‍රකාශයේ මූල්‍යාණය යන ප්‍රභවය යටතේ වෙන වෙනම පෙන්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ ගිණුම තුළ වැරදි ලෙස පෙන්වා තිබීම. | 0.71 | අපි විගණකගේ නිර්දේශය පිළිපදින අතර ඒ අනුව ගිණුම් සකස් කරන්නෙමු. | මූල්‍ය තත්ව ප්‍රකාශනයේ මූල්‍යාණය ප්‍රභවය යටතේ විනිමය ලාභය වෙන වෙනම පෙන්විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 මැයි සිට නොවැම්බර් දක්වා වන කාල සීමාව සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරය වෙත ගෙවන ලද රු.මිලියන 1.21 ක් වන උප ණය පොළිය මූල්‍ය ප්‍රකාශණ වෙත ගෙන නොතිබුණි. | 1.21 | මෙම ගණුදෙණුව ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල ලෙජරයේ යාවත්කාලීන කර ඇත්තේ ව්‍යාපෘති ගිණුම් සකස් කිරීම අවසන් වූ පසුවය. එය ව්‍යාපෘති පොත්තුල පසුව ගිණුම් ගත කර ඇත. | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශණ සැකසීමට පෙර අදාළ ව්‍යාපෘති වියදම් ගිණුම් ගත කිරීමට පියවර ගත යුතුය. |

**2.2 නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| අංකය | නීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | --------------------------------- | ------------- | ---------------------- | ---------------- |
| (අ) | 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයෙහි 2.3.2 වගන්තිය ප්‍රකාරව ඵලදායි ව්‍යාපෘති කළමණාකරණය සහතික කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා සෑම විටම පූර්ණකාලීන පදනමින් බඳවා ගත යුතුය. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය විසින් වැඩසටහන් ව්‍යාපෘති 1, 2 සහ වැඩසටහන් ව්‍යාපෘති 3 ක්‍රියාත්මක කළද, ව්‍යාපෘති අධ්‍යක්ෂකව අතිරේක සාමාන්‍යාධිකාරී තනතුරට උසස් කර 2021 පෙබරවාරි 2 දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික හා වත්කම් කළමණාකරණ අංශයේ රාජකාරී ආවරණය කිරීම සඳහා අනුයුක්ත කර තිබුණි. එබැවින්, ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීම සඳහා පූර්ණ කාලීන සේවා පදනම මත ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු පත්කිරීමට ජාතික | ප්‍රතිචාර දක්වා නැත. | පූර්ණ කාලීන සේවා පදනම මත ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු පත් කිරීමට පියවර ගත යුතුය. |

ජලසම්පාදන හා ජලාපවහන
මණ්ඩලය වහාම පියවර ගත
යුතුය.

## 3. භෞතික හා මූල්‍ය කාර්ය සාධනය

### 3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික කාර්යය සාධනය

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 3 කින් සමන්විත වන අතර ඒවා නම්, ව්‍යාපෘති 01 හා ව්‍යාපෘති 2 හි මූල්‍ය පරතරය පියවීම සඳහා අතිරේක මූල්‍යකරණය හා ව්‍යාපෘති සංවර්ධන ආධාරක කටයුතු සඳහා අරමුදල් සැපයීම වේ. තවද, ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 38 කට සමාන රු.මිලියන 4,940 ක් වෙන්කර ඇත. ඉන් රු.මිලියන 4,550 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 35 ක් ව්‍යාපෘති 01 හා ව්‍යාපෘති 02 හි මූල්‍ය පරතරය පියවීමට අතිරේක මූල්‍යණය සඳහා වෙන්කර ඇති අතර ව්‍යාපෘති සංවර්ධන ආධාරක කටයුතු සඳහා ඉතිරි රු. මිලියන 390 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 3 ක් වෙන්කර ඇත. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ආරම්භ කොට වසර 04 මාස 04 ක් ගතවී තිබුණද 2020 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘති සංවර්ධන ආධාරක වියදම් මිලියන 03 න් සියයට 16 ක් නියෝජනය කරන ඇමරිකානු ඩොලර් මිලියන 0.48 කට සමාන රු. මිලියන 80.67 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තව ද, මිලියන 35 න්, ව්‍යාපෘති 01 සහ ව්‍යාපෘති 02 හි මූල්‍ය පරතරය පියවීම සඳහා කිසිදු අරමුදලක් භාවිතා කර නොතිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ අඩු කාර්යසාධනය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය කාර්යසාධනය සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති සංවර්ධන ආධාරක වැඩවල එක් එක් සංරචකය යටතේ භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | සංරචකය / උප සංරචකය | 2020 දෙසැම්බර් 31 දිනට භෞතික කාර්ය සාධනය | | | | විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|---|
| | | තනි කොන්ත්‍රාත්තු සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් සංඛ්‍යාව | කෙරීගෙනයන කොන්ත්‍රාත් | නිමකල කොන්ත්‍රාත් | | | |
| (අ) | ව්‍යාපෘති සංවර්ධන ආධාර | | | | | | | |
| | i. උපදේශණ කොන්ත්‍රාත් | 10 | 10 | 02 | 08 | | ශක්‍යතා අධ්‍යනයන් සම්පූර්ණ කිරීම, සවිස්තරාත්මක සැලසුම් | ණය කාලය අවසන් වන දිනට පෙර |
| | ii. භාණ්ඩ හා | 20 | 20 | 04 | 16 | | සහ ලංසු ලේඛණ සකස් කිරීම | ව්‍යාපෘති සංවර්ධන |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| iii. | සේවා කොන්ත්‍රාත් ලේඛණ සකස් කිරීම යටතේ වන කොන්ත්‍රාත් | 18 | _ | _ | _ | ව්‍යාපෘතිය නිම කිරීම ප්‍රමාද වීම. | තුළින් අපේක්ෂිත ව්‍යාපෘති වල පෙර සූදානම ඇති කිරීමට ව්‍යාපෘති සංවර්ධන ආධාරක (ව්‍යා.සං.ආ) ණය මුදල ලබා දී ඇත. කෙසේ වෙතත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සැලසුම් හා නිර්මාණකරණ අංශයේ (සැ.සහ.නි.) සහ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානවල (ප්‍රා.ස.ම) තත්‍ය අවශ්‍යතාවයට අනුව ණය මුදල භාවිතා කර ඇත. | ආධාරක කටයුතු කොන්ත්‍රාත්තුන් ප්‍රදානය කිරීමට හා සම්පූර්ණ කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණයන් | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | ආරක්ෂක හමුදාවන්ගෙන් පූර්ව අවසරය ලබා නොගෙන යෝජිත පහළ පළිආරු ජලාශයේ භූ විද්‍යාත්මක සමීක්ෂණ කොන්ත්‍රාත්තුව (RSC(N)DGM/ADB/Pali/Sur/2020/2) 2020 සැප්තැම්බර් 02 දින ප්‍රදානය කර ඇත. පසුව, පලිආරු ප්‍රදේශයේ බිම් බෝම්බ ඉවත් නොකිරීම සම්බන්ධව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දැනුම්දීම මත කොන්ත්‍රාත්කරු විසින් සමීක්ෂණ කටයුතු නවතා දමා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රදේශයේ බිම් බෝම්බ ඉවත්කරන තෙක් සමීක්ෂණ කටයුතු අත්හිටුවා තිබුණි. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසු බලාපොරොත්තු නොවූ තත්වයක් ඇති විය. | ජල සම්පාදන ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතුය. |
| (ආ) | සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාලයන් සඳහා වන භූ විෂමතා සමීක්ෂණ කටයුතු කොන්ත්‍රාත්තුව (Hambegamuwa/survery/2019/204) සඳහා තෝරා ගැනීමේදී, මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබීම, අවම මූල්‍ය ධාරිතාව රු.මිලියන 3 ක් වීම, පසුගිය වසර 03 තුළ අවම වශයෙන් සමාන එක් කාර්යයක පළපුරුද්ද සහ එයට සමාන කෙරීගෙන යන කාර්යක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම වැනි ලංසු අවශ්‍යතා පිළිබඳ සාක්ෂි ලංසු ලිපිගොනු තුල නොතිබුණි. පසුව කොන්ත්‍රාත්කරු විසින් තම පෞද්ගලික කාරණයක් ලෙස දැනුම් දීමෙන් කොන්ත්‍රාත්තුව භාරගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. පසුව, දෙවන අඩුම ලංසුකරුට | අඩුම ලංසුකරු විසින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සමීක්ෂණ ව්‍යාපෘති සාර්ථකව නිම කර ඇත. කෙසේ වෙතත්, ලංසුකරුගේ පෞද්ගලික හේතූන් මත කොන්ත්‍රාත්තුව භාරගැනීම ලංසුකරු ප්‍රතික්ෂේප කර තිබුනි. | ලංසුකරුවන් ඇගයීමේදී ලංසු නිර්නායකයන් දැඩි ලෙස අනුගමනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. ඒ අනුව දුර්වල ලෙස කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු තෝරාගැනීම සඳහා ව්‍යාපෘතියට එක් වසරක් හා මාස හතරක කාලයක් ගත වී ඇත. | | |
| (ඇ) කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වැඩසටහන් ව්‍යාපෘති 03 සඳහා වෙනම කාර්ය මණ්ඩලයක් අනුමත කර නොතිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘති සංවර්ධන ආධාරක හා අනෙකුත් ව්‍යාපෘති කාර්යයන් යටතේ වන තනි කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ කටයුතු අනෙකුත් සමාන ව්‍යාපෘතින් වන ව්‍යාපෘති අංක 01 හා 02 හි කාර්ය මණ්ඩලය විසින් සිදු කිරීම නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, ඉන් නම් කරන ලද කාර්ය මණ්ඩලයක් වෙත ව්‍යාපෘති කටයුතු වල රාජකාරී පවරා පූර්ණ කාලීනව නිදහස් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, යාවත්කාලින ප්‍රසම්පාදන සැලැස්ම, උපදේශණ වාර්ථා හා වැඩ නියමිත දිනට ඉදිරිපත් කිරීම, වාර්ථා සමාලෝචනය කිරීම, කොන්ත්‍රාත්තු ප්‍රමාද වීම, ප්‍රමාද කොන්ත්‍රාත්හි පසු විපරම් කිරීම, සූදානම් කිරීමේ මූලාරම්භක කටයුතු පදනම් කරගෙන ව්‍යාපෘති ආරම්භ කිරීම වැනි කාර්ය සාධන තොරතුරු යනාදිය ව්‍යාපෘතිය විසින් කාලෝචිතව නඩත්තු කර නොතිබූ අතර තනි කොන්ත්‍රාත්කරුවන් සහ ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථාන අතර අධීක්ෂණය හා සම්බන්ධීකරණයක් නොමැති වීම ද නිරීක්ෂණය විය. ඒ අනුව, ව්‍යාපෘතියේ ව්‍යාපෘති සංවර්ධන ආධාරක යටතේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගත හැකිද යන්න විගණනයට සැක සහිත විය. | නව ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා ව්‍යාපෘති සංවර්ධන ආධාරක (ව්‍යා.සං.ආ) ණය මුදල ලබාදී ඇත. එබැවින් මුල් අවධියේදී අපට අවශ්‍ය කාර්ය මණ්ඩල සංඛ්‍යාව හඳුනාගත නොහැක.<br>ප්‍රසම්පාදන කටයුතු ව්‍යාපෘති කාර්යාලය විසින් සිදුකරනු ලබන අතර ක්‍රියාත්මක කිරීමේ කටයුතු සිදුකරනු ලබන්නේ අදාළ ප්‍රදේශීය සහාය සේවා මධ්‍යස්ථානය (ප්‍රා.ස.ම) සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සැලසුම්කරණය හා නිර්මාණකරණ අංශය (සැ.සහ.නි) විසිනි. එය අනාගතයේදී නිවැරදි කරනු ඇත. | ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වගකීම් නියම කරමින් පූර්ණ කාලීනව වෙනම කාර්ය මණ්ඩලයක් පත් කිරීමට පියවර ගත යුතුය. |

**3.3 මතභේදයට තුඩු දුන් කරුණු**

| විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂ සඳහා දේශීය අරමුදල් ප්‍රතිපාදන වෙන්කර නොතිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 1.9 ක් වැය කර තිබුනි. | ප්‍රතිචාර දක්වා නැත. | කළමණාකරණ මෙවලමක් ලෙස අයවැය ඇස්තමේන්තු සකස් කර ඒ අනුව උපයෝජනය කළ යුතුය. |

## 3.4 ඌණ උපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ කටයුතු කරගෙන යාම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 38 කට සමාන රු. මිලියන 4,940 ක් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට වෙන්කර ඇත. කෙසේ වෙතත් ඊට සමාන වන ව්‍යාපෘති 01 හා 02 හි දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය ආරම්භකොට වසර 04 ක් හා මාස 04 ක් ගතවී තිබුණද සියයට 1.26 ක් නියෝජනය කරන ඇමරිකානු ඩොලර් මිලියන 0.48 කට සමාන රු. මිලියන 80.67 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එබැවින් ව්‍යාපෘති කාලය සීමාව 2022 ඔක්තෝම්බර් 24 දක්වා දීර්ඝ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ව්‍යාපෘතියේ බෙදාහැරීම් ශේෂය මත අයවන බැදීම් ගාස්තු ප්‍රමාණය ණය ගිවිසුමේ ඇස්තමේන්තු ගත ප්‍රමාණයට වඩා ඉහල යාහැකි බවට නිරීක්ෂණය විය. | එක්සත් ජනපද ඩොලර්වලට සාපේක්ෂව රුපියල් අවප්‍රමාණය වීම නිසා අදියර 1 හා 2 යටතේ සැලකිය යුතු ඉතිරියක් අප හඳුනාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස අදියර 1 හි ණය මුදල 2020 පෙර උපයෝජනය කිරීමට නොහැකි විය. පසුව ඉතිරිවීම් ප්‍රයෝජනය සඳහා ණය ප්‍රමාණය තවදුරටත් කාලය දීර්ඝ කිරීමකින් තොරව උපයෝජනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකු බැදීම් ගාස්තු ප්‍රතිශතය 2019 සිට 100% දක්වා වැඩි කරන ලදී. ඔබ දන්නා පරිදි කොළඹ මහනගර සභාවේ ණය අවශ්‍යතාවය හේතුවෙන් 2016 අගෝස්තු මාසයේදී ව්‍යාපෘති 1 සහ 2 සඳහා අතිරේක මූල්‍යකරණයක් ලෙස අදියර 3හි ණය මුදල ලබා දී ඇත. කෙසේ වෙතත් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සැබෑ අවශ්‍යතාවය 2019 දී විය. | ව්‍යාපෘතියේ අනාගත අවශ්‍යතාවය සමාලෝචනය කිරීමෙන් පසු අතිරේක අරමුදල් ඉල්ලා සිටිය යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ කාල සීමාව 2022 ඔක්තෝම්බර් 24 දක්වා දීර්ඝ කර තිබුණද, අතිරේක මූල්‍ය අරමුණු සඳහා සංශෝධිත අරමුදල් යෙදවීමේ සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැසුම ව්‍යාපෘතිය විසින් සකස් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති කාල සීමාව තුළ අරමුදල් උපයෝජනය කිරීම සැක සහිත වේ. | ණය දිර්ග කිරීමේ කාලයට අදල සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මක් ආසියානු සංවර්ධන බැංකුවට ඉදිරිපත් කරන ලදී. ඔබගේ යොමුව සඳහා ඇමුණුමක් ලෙස මෙහි අමුණා ඇත. (ඇමුණුම 1 හා ඇමුණුම 2) | ව්‍යාපෘතිය විසින් වැඩ සටහන් ව්‍යාපෘති 1 හා 2 සඳහා සමස්ථ ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කර ඇත. වැඩසටහන ව්‍යාපෘති 3 සඳහා සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කල යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2020 වර්ෂය සඳහා රු.මිලියන 250 ක විදේශ අරමුදල් ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටියද සත්‍ය ලෙස ප්‍රතිපාදන ලෙස රු.මිලියන 227.79 ක් ලැබී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ප්‍රතිපාදනයක් භාවිතා කර නොමැති විය. එබැවින්, ව්‍යාපෘතියේ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව විදේශීය අරමුදල් සඳහා වන අයවැය ප්‍රතිපාදන ඉල්ලා නොතිබීම නිරීක්ෂණය විය. | පවත්නා කොවිඩ් -19 තත්වය හේතුවෙන් ටෙන්ඩර් ප්‍රදානය කිරීම හා ඉදිකිරීම් කාර්ය සාධනයෙහි සැලකිය යුතු ප්‍රමාදයක් දක්නට ලැබුණි. | වෙන්කල සම්පත් නියමිත කාල සීමාව තුල උපයෝජනය කිරීමට පියවර ගත යුතුය. |

**3.5 පද්ධති හා පාලන**

| **විගණන නිරීක්ෂණ** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **විගණකගේ නිර්දේශය** |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති අංක 05 දරන චක්‍රලේඛයට අනුව ව්‍යාපෘතියේ ගණුදෙනු ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් නොවීය. | ප්‍රතිචාර දක්වා නොමැත. | අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |